# ගිණුම් නිලධාරී තනතුර සහ පරිපාලන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම

# ගාලු උරුමය පදනම

## ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

### පරිපාලන නිලධාරී තනතුර (තනතුරු එකයි)
### ගිණුම් නිලධාරී තනතුර (තනතුරු එකයි)

ගාලු උරුමය පදනමේ ඉහත තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම්පත්, එහි සඳහන් සුදුසුකම් වලට අදාළ සහතික පත්‍රවල ඡායාපිටපත් සමග අමුණා, 2022 මැයි මස 06 වන දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති, ගාලු උරුමය පදනම, නො. 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය.

ගිණුම් නිලධාරී තනතුර සඳහා තිබිය යුතු අවම සුදුසුකම් සහ රාජකාරියේ ස්වභාවය

**අවම සුදුසුකම්**

(1) (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක (වාණිජවේදී / කළමනාකරණ / ගිණුම්කරණ) උපාධියක් ලබා තිබීම හෝ සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව ලබා තිබීම

සහ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර්මාධ්‍ය සමත්වීම (ICASL) හෝ වරලත් කළමනාකරණ ගිණුම්කරණ ආයතනයේ අන්තර් මාධ්‍ය සමත්වීම (CIMA) හෝ ගිනුම්කරණ සහතික කරන්නන්ගේ සංගමයේ අන්තර් මාධ්‍ය (ACCA) සමත්වීම.

(ඉහත සඳහන් අන්තර් මාධ්‍ය විභාග වලට අදාළව වෘත්තීය ගණකාධිකාරී ආයතන විසින් පසුකාලීනව අදාළ පාඨමාලා සංශෝධනය කිරීමේදී අන්තර් මාධ්‍ය සුදුසුකම් වලට ගැළපෙන සුදුසුකම්ලත් පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය)

(2) පරිගණක පැකේජ මගින් ගිණුම් කටයුතු මෙහෙයවීම හා වාර්තා සකස් කිරීමේ හැකියාව

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**රාජකාරියේ ස්වභාවය**

ගාලු උරුමය පදනමේ සියලුම මූල්‍ය කටයුතු පාලනය හා ගිණුම් කටයුතු කළමනාකරණය, වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදයම් උත්පාදන මාර්ගයන්හි ආයෝජන කටයුතු සිදු කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම හා ඒ සම්බන්ධව රැස්වීම් වලට සහභාගි වීම, අමාත්‍යාංශය සමග මූල්‍ය ගනුදෙනු පිළිබඳ කටයුතු සිදු කිරීම හා සම්බන්ධීකරණය ඇති කිරීම, වාර්ෂික විගණන කටයුතු සිදු කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම, ආයතන ප්‍රධානියා විසින් වරින් වර පවරන වෙනත් කාර්යයන් ඉටු කිරීම.

**පරිපාලන නිලධාරී තනතුර සඳහා තිබිය යුතු අවම සුදුසුකම් සහ රාජකාරියේ ස්වභාවය**

**අවම සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසුව රජය පිළිගත් ආයතනයක මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 03 ක අවම පළපුරුද්දක් ලබා තිබීම.

**රාජකාරියේ ස්වභාවය**

කාර්යාලයේ කටයුතු පරිපාලනය, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම, ආයතන ප්‍රධානියා විසින් වරින් වර පවරන වෙනත් කාර්යයන් ඉටු කිරීම.

**තනතුරු දෙකටම අදාළ වන පොදු කොන්දේසි**

01. මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක විය යුතුය.

02. පත්වීම් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත්ව තනතුරට පත් කරනු ලැබේ.

03. වයස් සීමාව (අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට) : අවුරුදු 22 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

04. **වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ 2(2016) පරිදි මාසිකව 42600 – 10 X 755 – 18 X 1135 – 70580 සහ රජයේ අනුමත ජීවන වියදම් දීමනාව (ඉහත වැටුප් පරිමානයට අදළ ආරම්භක වැටුප් පියවරේ පිහිටවනු ලැබේ)

05. පරිගණක භාවිතය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

06. **බඳවාගැනීමේ ක්‍රමය :** ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහ ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

07. අයදුම්කරුවන් පිළිබඳව විමසා බැලීම සඳහා ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම් පත්‍රයේ සඳහන් කර තිබිය යුතුය.

08. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / පළාත් රාජ්‍ය සභා සේවය / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතනවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම්පත www.galleheritage.gov.lk ගාලු උරුමය පදනමේ නිල වෙබ් අඩවියෙන් බාගත හැකිය.

**පරාක්‍රම දහනායක**
**සභාපති,**
**ගාලු උරුමය පදනම,**
**නො. 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.**
**දුරකථන අංකය : 0912246784**